# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,503 — 1965 සැප්තැම්බර් 11 වැනි සෙනසුරාද — 1965.9.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වන කොටස: (I) වන ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනත

**10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි**

### ක/උතුරු කළුතර මෙතෝදිස්ත සිංහල මිශ්‍ර පාසල, කළුතර

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත්, ඉමියා මුදියන්සේලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින්, 1962 වර්ෂයේ මැයි මාසයේ 14 වෙනි දින අංක 13,109 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පලවූ අංක 1249 දරන පැවරුම් නියෝගය මෙහි පහත සඳහන්වන උප ලේඛනයෙහි විස්තර කොට දැක්වෙන දේපල වලට අදාලවන තාක් දුරට, 1962 වර්ෂයේ ජූනි මාසයේ 1 වෙනි දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරමි.

අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅළ/891
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 සැප්තැම්බර් මාසයේ 6 වෙනි දින දීය.

**උපලේඛනය**

1. බස්නාහිර පලාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණේ කළුතර බැද්දේ උතුරු කළුතර පිහිටා ඇත්තාවූත් මහවත්ත යනු වෙන් හැඳින්වෙන්නාවූ ඉඩමෙන් කොටසක්වූත් බලයලත් මැනුම් කරු හා මට්ටම්කරු ඇල්. ආර්. ඇල්. පෙරේරා මහතා විසින් සාදන ලද 1965.1.18 දින හා අංක 479 දරන පිඹුරේ අංක 2 ලෙස දක්වා ඇති බිම් කැබැල්ල එනම්: උතුරින්: ලහාවෙත පාරෙන්ද; නැගෙනහිරින්: ඊ. ආර්. මැන්ඩිස්ගේ දේපලින්ද; දකුණින් හා බස්නාහිරින්: එකී අංක 479 දරණ පිඹුරේ අංක 1 ලෙස දැක්වෙන ඉඩම් කැබැල්ලෙන්ද, මැසිම්වූ (අ. 0, රූ. 0, ප. 27) පර්චස් 27 ක් විශාල ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

2. මෙම උප ලේඛනයේ 1 වැනි ඡේදයෙහි වෙසෙසා දැක්වෙන ඉඩමෙහි පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ලම.

9-546/1

---

### 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනත

**10 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි**

### යා/යාපනයේ හින්දු විද්‍යාලය, යාපනය

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත්, ඉමියා මුදියන්සේලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින්, 1962 වර්ෂයේ ජූලි මාසයේ 13 වෙනි දින අංක 13,209 දරන ලංකාණ්ඩුවේ (අති විශේෂ) ගැසට් පත්‍රයෙහි පලවූ අංක 1515 දරන පැවරුම් නියෝගය, මෙහි පහත සඳහන්වන උපලේඛනයෙහි විස්තර කොට දැක්වෙන දේපොලට අදාලවන තාක් දුරට, 1962 වර්ෂයේ අගෝස්තු මාසයේ 1 වෙනි දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරමි.

අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල, .
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅළ/472
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 සැප්තැම්බර් මාසයේ 6 වෙනි දින දිය.

**උපලේඛනය**

උතුරු පලාතේ යාපනය දිස්ත්‍රික්කයේ හා නාගරික සභාව තුළ, වන්නාර්පොන්නෙයිහි පිහිටියාවූත්, උතුරට: විද්‍යාල පාරෙන්ද, නැගෙනහිරට: ආර්. ෂන්මුගම් මහත්මිය අයිතිවාසි කම් කියන ඉඩමෙන්ද, දකුණට: යා/වෙට්ටිනිරු (මැ. මී) දෙමළ මිශ්‍ර පාසැලට අයත් භූමි භාගයෙන් සහ කමරයියා නඩරාජා විසින් අයිතිවාසි කම් කියන ඉඩමෙන්ද, බස්නාහිරට: ඇස්. යූ. රාජතුංගම්ගේ උරුමක්කාරයින් විසින් අයිතිවාසි කම් කියන ඉඩමෙන්ද, මැසිම්වූත් ප්‍රමාණයෙන් ලාවම් 8 ක් පමණවූත් ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

2. මෙම උප ලේඛනයේ 1 වෙනි ඡේදයෙහි වෙසෙසා දැක්වෙන ඉඩමෙහි පිහිටි සියළුම ගොඩනැගිලි හා නිර්මාණයන්.

9-546/2

---

### 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනත

**10 වෙනි වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි**

### යා/යූනියන් විද්‍යාලය, තෙල්ලිපළෙයි

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය තැන්පත්, ඉමියා මුදියන්සේලාගේ රපියල් අභයවන්ස ඊරියගොල්ල වන මම, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින්, 1963 වර්ෂයේ ජනවාරි මාසයේ 31 වෙනි දින අංක 13,496 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පලවූ අංක 2069 ඒ දරන පැවරුම් නියෝගය මෙහි

පහත සඳහන් වන උප ලේඛනයෙහි දක්වෙන දේපොල වලට අදාල වන තාක් දුරට, 1963 වර්ෂයේ පෙබරවාරි මාසයේ 15 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅළ/484

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 සැප්තැම්බර් මාසයේ 6 වෙනි දින දීය.

### උපලේඛනය

උතුරු පලාතේ යාපනය දිස්ත්‍රික්කයේ වලි උතුරු ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශයේ තෙල්ලිපලෙයිහි පිහිටා ඇත්තාවූද, බලයලත් මැනුම්කරු හා මට්ටම්කරු පී. ඒ. සේනාතිරාජා මහතා විසින් සාදනලද අංක 106 හා 1964.4.17 දින දරණ පිඹුරේ දක්වා ඇත්තාවූද, උතුරෙන් : පන්ඩතෙරුප්පු-තෙල්ලිපලෙයි පාරෙන්ද, නැගෙනහිරින් : කන්කේසන්තුරේ-යාපනය පාරෙන්ද, දකුණෙන් හා නැගෙනහිරින් : ඇස්. සිතම්පරපිල්ලේ මහතාට සහ සතියනාදන් මහත්මියට අයත්යයි කියන දේපලින් මායිම්වූ ඉඩම් කොටස සම්පූර්ණයෙනි.

2. මෙම උපලේඛනයෙහි 1 වෙනි ඡේදයෙහි වෙසෙසා දැක්වෙන ඉඩමෙහි පිහිටි ගොඩනැගිලි හා නිර්මාණයන් සියල්ලම.

9-546/3

---

## 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනත

**හලා/වෙන්නප්පුව (රෝමානු කතෝලික) පිරිමි පාසැල, වෙන්නප්පුව**

1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනතේ 4 වගන්තිය යටතේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය වරයා විසින් කරනු ලබන නියෝගයයි.

අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති.

ජාපාඅළ/295/සාපා.
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 3, 1965 සැප්තැම්බර් 6 දින දීය.

### නියෝගය

වෙන්නප්පුව, හලා/වෙන්නප්පුව (රෝමානු කතෝලික) පිරිමි පාසැල සම්බන්ධයෙන් 1962 සැප්තැම්බර් මස 8 වැනි දින අංක 13,296 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ 1962 අගෝස්තු මස 31 වෙනි දින අංක 1849 දරණ පැවරුම් නියෝගය, එහි උප ලේඛනයෙහි 1 වැනි ඡේදය වෙනුවට මතු දක්වෙන ඡේදය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"1 (ඒ) 1960 ජූලි මස 21 දින හලා/වෙන්නප්පුව (රෝමානු කතෝලික) පිරිමි පාසැල පවත්වා නඩත්තු කරනු ලැබූ ස්ථානය, එනම් :— වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරලේ උල්හිටියාවේ පිහිටා ඇති, වෙන්නප්පුව රෝමානු කතෝලික පිරිමි පාසැල් භූමි භාගය නමින් හඳුන්වනු ලබන මෙහි පහත දක්වෙන මායිම් තුළ පිහිටි ඉඩම් කොටස සම්පූර්ණයෙනි. එකී ඉඩම් කොටසට මායිම්—

බස්නාහිරින් : පරණ නැපැල් කන්තෝරුව පාරේ සිට දකුණු දෙසට වැටී ඇති ගම්සභා පාර ;

උතුරින් : එකී පරණ නැපැල් කන්තෝරුව පාරේ සිට අඩි 169 ක් දකුණු දෙසට බස්නාහිර මායිමේ වූ ස්ථානයකින් ආරම්භව එහි සිට අඩි 118 ක් නැගෙනහිර දෙසටද, එතැන් සිට සෘජු කෝණාශ්‍රව අඩි 80ක් උතුරු දෙසටද, එතැන් සිට සෘජු කෝණාශ්‍රව අඩි 213 ක් නැගෙනහිර දෙසටද, නැවතත් සෘජු කෝණාශ්‍රව ඉහතකී පරණ නැපැල් කන්තෝරුව පාර සමු වන තෙක් උතුරු දෙසටද, එතැන් සිට එකී පරණ නැපැල් කන්තෝරුව පාර දිගේ අඩි 232 ක් නැගෙනහිර දෙසට විහිදී එතැන් සිට සෘජු කෝණාශ්‍රව අඩි 93 ක් දකුණු දෙසටද, නැවතත් සෘජු කෝණාශ්‍රව කොළඹ-පුත්තලම් පාර සමු වන තෙක් නැගෙනහිර දෙසටද විහිදෙන රේඛාවකි.

නැගෙනහිරින් : කොළඹ-පුත්තලම් පාර ;

දකුණින් : ඉහතකී උතුරු මායිමේ නැගෙනහිර කෙළවරේ සිට අඩි 114 ක් දකුණින්, නැගෙනහිර මායිමේ වූ ස්ථානයකින් ආරම්භව, බස්නාහිර දෙසට අඩි 274 ක් ද, එතැන් සිට සෘජු කෝණාශ්‍රව උතුරු දෙසට අඩි 13 ක් ද, එතැන් සිට සෘජු කෝණාශ්‍රව බස්නාහිර දෙසට අඩි 235 ක් ද, එතැන් සිට සෘජු කෝණාශ්‍රව දකුණු දෙසට අඩි 81 ක් ද, විහිදී නැවතත් සෘජු කෝණාශ්‍රව බස්නාහිර දෙසට ගැටී ඉහත කී ගම් සභා පාර දක්වා විහිදී යන රේඛාවකි.

(බී) පාසැල් භූමියට පිවිසීමට ඇති මාර්ගය, ජල සම්පාදන ක්‍රමය හා විදුලි යන්ත්‍ර ස්ථානය සැම කල්හිම පරිහරණය කිරීමේ සම්පූර්ණ අයිතිය හා නිදහස."

9-546/4

---

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

**12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය**

අධ්‍යාපන අධ්‍යක්ෂ තැන්පත් අර්නස්ට් හර්බට් ද අල්විස් වන මම, 1962 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ 26 වෙනි දින අංක 13,363 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද, දෙවලපොල, මී/බලබෝව බෞද්ධ බාලිකා පාසලේ සියළුම දේපල, 1965 වර්ෂයේ මැයි මාසයේ 12 වෙනි දින අංක 14,396 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ නියෝගයෙන් සංශෝධිත පරිදි, රජය වෙනුවෙන් භාර ගැනීමට, මිනුවන්ගොඩ මණ්ඩලයේ, පාඨශාලා පරීක්ෂක තැන්පත් කස්තුරි ආරච්චිල්ලාගේ පියසේන මහතාට මෙයින් බලය පවරමි.

2. එකී කස්තුරි ආරච්චිල්ලාගේ පියසේන මහතා රජය වෙනුවෙන් පූර්වෝක්ත දේපල භාර ගැනීම වැලැක්වීමට හෝ බාධා කිරීමට හෝ විරෝධය දැක්වීමට උත්සාහ කරන සෑම පුද්ගලයෙක්ම එකී පනත යටතේ වරදකරුවකු වෙනුවා පමණක් නොව, එකී පනතේ 27 වෙනි වගන්තිය යටතේ දඬුවමට භාජන කරනු ලැබිය හැකි ද වේ.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

(ජාපාඅළ/1084)
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය,
කොළඹ 2,
1965 සැප්තැම්බර් 6 වෙනි දින දී ය.

9-547/1

---

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

**12 (2) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය**

මිනුවන්ගොඩ මණ්ඩලයේ පාඨශාලා පරීක්ෂක තැන්පත් කස්තුරි ආරච්චිල්ලාගේ පියසේන වන මම, 1965 වර්ෂයේ මැයි මාසයේ 12 වෙනි දින අංක 14,396 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ නියෝගයෙන් සංශෝධිත පරිදි 1962 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ 26 වෙනි දින අංක 13,363 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ පැනවුණු පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද දෙවලපොල, මී/බලබෝව බෞද්ධ බාලිකා පාසලට අයත් දේපල 1965 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ 24 වෙනි සිකුරාදා පෙරවරු 9.30ට, එකී මී/බලබෝව බෞද්ධ බාලිකා පාසලේ දී රජය සඳහා ද, වෙනුවෙන් ද භාර ගැනීමට අදහස් කරන බව, එම පාසලේ දේපල ගැන අයිතිවාසිකම් ඇති සියලුදෙනා වෙතම මෙයින් දැනුම් දෙමි.

(2) එම දේපලට අයිතිවාසිකමක් ඇති සියලු දෙනාම නැතහොත් ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් මෙහි (1) ඡේදයෙහි සඳහන් වූ දිනයෙහි නියමිත වේලාවට එකී ස්ථානය වෙත පැමිණ එම දේපල රජය සඳහා ද, වෙනුවෙන් ද භාර ගැනීමට මට ඉඩ දෙන ලෙසත්, සහාය වන ලෙසත් මෙයින් නියෝග කරමි.

කේ. ඒ. පියසේන,
පාඨශාලා පරීක්ෂක.

1965 සැප්තැම්බර් මස 6 වෙනි දින,
මිනුවන්ගොඩ දී ය.

9-547/2

---

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

**12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය**

අධ්‍යාපන අධ්‍යක්ෂක තැන්පත් අර්නස්ට් හර්බට් ද අල්විස් වන මම, 1962 වර්ෂයේ ජනවාරි මාසයේ 12 වෙනි දින අංක 12,876 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද මී/කෝන්ගොඩමුල්ල රෝමානු කතෝලික සිංහල පිරිමි පාසැලේ සියළුම දේපල, 1965 වර්ෂයේ මැයි මාසයේ 12 වෙනි දින අංක 14,396 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ නියෝගයෙන් සංශෝධිත පරිදි රජය වෙනුවෙන් භාර ගැනීමට දිවුලපිටිය මණ්ඩලයේ පාඨශාලා පරීක්ෂක තැන්පත් දොන් ඒබ්‍රහම් ජයකොඩි මහතාට මෙයින් බලය පවරමි.

2. එකී දොන් එබ්‍රහම් ජයකොඩි මහතා රජය වෙනුවෙන් පූර්වෝක්ත දේපල භාරගැනීම වැලැක්වීමට හෝ බාධා කිරීමට හෝ විරෝධය දැක්වීමට උත්සාහ කරන සැම පුද්ගලයෙක්ම එකී පනත යටතේ වරදකරුවකු වෙනුවා පමණක් නොව, එකී පනතේ 27 වෙනි වගන්තිය යටතේ දඬුවමට භාජනය කරනු ලැබිය හැකි ද වේ.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

ජපාඅට/1035,
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය,
කොළඹ 2,
1965 අගෝස්තු මස 28 වෙනි දින දීය.
9-547/3

---

## 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

### 12 (2) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

දිවුලපිටිය මණ්ඩලයේ පාඨශාලා පරීක්ෂක තැන්පත් දොන් එ්බ්‍රහම් ජයකොඩි වන මම, 1965 වර්ෂයේ මැයි මාසයේ 12 වෙනි දින අංක 14,396 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ නියෝගයෙන් සංශෝධිත පරිදි 1962 වර්ෂයේ ජනවාරි මාසයේ 12 වෙනි දින අංක 12,876 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ, 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනතේ 4 වෙනි වගන්තිය යටතේ පැනවුණු පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද මී/කෝන්ගොඩමුල්ල රෝමානු කතෝලික සිංහල පිරිමි පාසැලට අයත් දේපල 1965 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ 4 වෙනි සඳුදා පෙරවරු 9.30 ට, එකී මී/කෝන්ගොඩමුල්ල රෝමානු කතෝලික සිංහල පිරිමි පාසැලේදී රජය සඳහාද, වෙනුවෙන්ද භාර ගැනීමට අදහස් කරන බව, එම පාසැලේ දේපල ගැන අයිතිවාසිකම් ඇති සියළු දෙනා වෙතම මෙයින් දැනුම් දෙමි.

(2) එම දේපලට අයිතිවාසිකමක් ඇති සියලු දෙනාම නැතහොත් ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් මෙහි (1) ඡේදයෙහි සඳහන් වූ දිනයෙහි නියමිත වේලාවට එකී ස්ථානය වෙත පැමිණ එම දේපල රජය සඳහා ද, වෙනුවෙන් ද භාර ගැනීමට මට ඉඩ දෙන ලෙසත්, සහාය වන ලෙසත් මෙයින් නියෝග කරමි.

ඩී. ඒ. ජයකොඩි,
පාඨශාලා පරීක්ෂක.

1965 අගෝස්තු මස 28 වැනි දින,
දිවුලපිටියේදීය.
9-547/4

ලංකාවේ වැලව්වේතයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි